**ගැටුම්වල බලපෑමට ලක් වූ ප්‍රදේශවල ප්‍රජා ජීවනෝපායයන් පිළිබඳ ව්‍යාපෘතිය-(යළි පිබිදෙන ව්‍යාපෘතිය)-2015**

---

ගැටුම්වල බලපෑමට ලක් වූ ප්‍රදේශවල ප්‍රජා ජීවනෝපායයන් පිළිබඳ ව්‍යාපෘතියේ (යළි පිබිදෙන ව්‍යාපෘතිය) 2015 ජනවාරි 01 දින සිට අප්‍රේල් 30 දක්වා කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2007 සැප්තැම්බර් 25 දිනැති ගිවිසුමෙන් සංශෝධිත 2004 ජූලි 23 දින එළඹි අංක 3935 සීර් දරන සංවර්ධන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.01 (ආ) (i) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පසුව, මෙම ව්‍යාපෘතියට අතිරේක මූල්‍යයනය සැපයීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2010 ජනවාරි 11 දින අංක 4671 එල්කේ දරන දෙවැනි මූල්‍යයන ගිවිසුම හා 2011 නොවැම්බර් 29 දින අංක 4956 එල්කේ දරන තෙවන මූල්‍යයන ගිවිසුම අත්සන් කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ මූල්‍යයන ගිවිසුම්වලට අනුව, එවකට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ ප්‍රතිපත්ති සැලසුම් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. තිරසාර, සමාජයීය හා ආර්ථික ප්‍රතිසංකලනය සඳහා ජීවනෝපායයන් ප්‍රතිස්ථාපනය කිරීම, කෘෂිකාර්මික හා වෙනත් නිෂ්පාදන සහ ආදායම හා ධාරිතා වර්ධනය වැඩිදියුණු කිරීම සඳහා උතුරු හා නැගෙනහිර පළාත්වල සහ තදාසන්න ප්‍රදේශවල ගැටුම්වල බලපෑමට ලක් වූ ප්‍රජාව සඳහා ආධාර කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. මූල්‍ය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 16,844.42 කට සමාන එජඩො මිලියන141.14 ක් වන අතර ඉන් එජඩො මිලියන 124.70 ක් මූල්‍යයනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ශ්‍රී ලංකා රජයේ සහ ව්‍යාපෘතියේ ප්‍රතිලාභින්ගේ දායකය පිළිවෙලින් එජඩො මිලියන 13.72 ක් හා එජඩො මිලියන 2.72 ක් විය. 2004 ජූලි 23 දින ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කරන ලද අතර 2014 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘති කාර්යයන් නිම කිරීමේ දිනය 2015 අප්‍රේල් 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ

අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම්, ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2015 අප්‍රේල් 30 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව,

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඒ) මාගේ පෙර වර්ෂයේ විගණනයෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) මූල්‍ය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම හැරුණු විට, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 අප්‍රේල් 30 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 අප්‍රේල් 30 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම්, ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2015 අප්‍රේල් 30 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඈ) මූල්‍ය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණනයෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඉ) මූල්‍ය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

### 2.2 ගිණුම්කරණ අඩුපාඩු

දිස්ත්‍රික්ක 09 ක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකවල 2015 අප්‍රේල් 30 දිනට අත පැවති රු.මිලියන 18.7 ක් වූ මුදල් ශේෂය හා බැංකුවල පැවති රු.මිලියන 297.5 ක් වූ වෙනත් ශේෂ, හෙළිදරව් කිරීමෙන් තොරව ව්‍යාපෘතියේ ක්ෂුද්‍ර මූල්‍ය යෝජනාක්‍රම සඳහා ලබාදුන් උප ණය යටතේ දක්වා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යායනය, සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ හා 2015 අප්‍රේල් 30 දක්වා අරමුදල් උපයෝජනයට අදාළ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම්වලට අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ | | 2015 අප්‍රේල් 30 දක්වා | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජාසංසං | | | | | | | |
| ණය අංකය | | | | | | | |
| 3935 | 64.70 | 8,217.44 | 503 | 2.31 | 254.17 | 64.78 | 7,125.60 |
| 4671 | 12.00 | 1,400.28 | - | - | - | 10.36 | 1,351.56 |
| 4956 | 48.00 | 5,582.70 | 147 | 0.36 | 39.50 | 54.04 | 5,944.51 |
| ශ්‍රී ලං ර | 13.72 | 1,372.00 | 75 | 0.36 | 39.53 | - | 1,788.91 |
| ප්‍රතිලාභීන් | 2.72 | 272.00 | - | - | - | - | 153.55 |
| එකතුව | 141.14 | 16,844.42 | 725 | 3.03 | 333.20 | 129.18 | 16,364.13 |

## 3.2 භෞතික ප්‍රගතිය

මූල්‍ය ගිවිසුම් අනුව, ගම් පුනරුත්ථාපනය කිරීම හා සංවර්ධන කටයුතු, විශාල වාරිමාර්ග යෝජනා ක්‍රම/ කුඩා වැව් පුනරුත්ථාපනය කිරීම, පොකුරු මට්ටමේ ජීවනෝපාය කාර්යයන් සහ ජල ගැල්මෙන් වූ හානි පුනරුත්ථාපනය කිරීමේ කාර්යයන් යන සංරචක යටතේ ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය යටතේ ස්ථාපිත කරන ලද ග්‍රාම සංවර්ධන සංවිධානයන් මඟින් ව්‍යාපෘති කාර්යයන් ක්‍රියාත්මක කර තිබූ බව නිරීක්ෂණය වූ අතර පහත සඳහන් හේතූන් මත ග්‍රාම සංවර්ධන සංවිධානයන් පිළිබඳ තිරසාරත්වය තහවුරු කර ගත නොහැකි බැවින් ව්‍යාපෘති කාර්යයන් පිළිබඳ අඛණ්ඩ මෙහෙයුම් සිදුකිරීම සැකසහිතව පැවතුණි.

(i) ව්‍යාපෘති විසින් ස්වාධීන විගණනයක් මඟින් ග්‍රාම සංවර්ධන සංවිධානයන්හි මූල්‍ය ස්ථායීතාවය ව්‍යාපෘති කාලපරිච්ඡේදය අවසානයේදී ඇගයීම් කර නොතිබුණි.

(ii) ව්‍යාපෘතියේ කාර්යයන් අවසන් කිරීමෙන් පසුව, ග්‍රාම සංවර්ධන සංවිධානවල සාර්ථකත්වය සඳහා ස්වේච්ඡාවෙන් දායකවන ප්‍රජා සම්පත් දායකයන් මඟින් ග්‍රාම සංවර්ධන සංවිධානයන්හි මෙහෙයුම් පිළිබඳ සම්බන්ධීකරණ හා නියාමන කාර්යයන් ක්‍රියාත්මක කිරීම අදාළ දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් අපේක්ෂා කර තිබුණි. පදවි ශ්‍රී පුර ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධන සංවිධානයන් පිළිබඳව විගණකවරුන් කරන ලද භෞතික පරීක්ෂාවේදී, ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ප්‍රජා සම්පත් දායකයන්ට ගෙවන ලද රු.7,000 සිට රු.9,000 දක්වා වූ මාසික දීමනාව අත්හිටුවීම

හේතුවෙන් ග්‍රාම සංවර්ධන සංවිධාන වෙනුවෙන් ඔවුන්ගේ කාලය කැප කිරීම අධෛර්ය වී තිබූ අනාවරණය විය.

(iii) ප්‍රගති වාර්තා අනුව, ග්‍රාම සංවර්ධන සංවිධාන 805 ක් ස්ථාපිත කර තිබූ අතර ඉන් ග්‍රාම සංවර්ධන සංවිධාන 723 ක් පමණක් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ලියාපදිංචි කර තිබුණි. තවද ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ස්ථාපිත කරන ලද ග්‍රාම සංවර්ධන සංවිධාන 51 කින් 12 ක් පමණක් ලියාපදිංචි කර තිබුණි. වැඩ බිම් පරීක්ෂාවලදී, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පදවි ශ්‍රී පුර ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ ස්ථාපිත කරන ලද ග්‍රාම සංවර්ධන සංවිධාන 09 කින් 05 ක් ක්‍රියාත්මක වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) කේන්ද්‍රීය ගම් 237 ක ස්වයං ආධාර (self – help) ආදායම් උත්පාදන කාර්යයන් ඇතිකිරීම සඳහා කුඩා කණ්ඩායම් සහභාගීත්වය මඟින් ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රම ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කර තිබුණි. ලැබුණු තොරතුරු අනුව, ඒ සඳහා උප ණය ලබාදීමට ව්‍යාපෘතිය විසින් රු.මිලියන 1,231.05 ක් වැය කර තිබුණි. කෙසේ වුවද පහත සඳහන් කරුණු හේතුවෙන් ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රමවල මෙහෙයුම් පිළිබඳ තිරසාරත්වය සැක සහිතව පවතී.

(i) ලබාදෙන ලද උපණය අයකර ගැනීමේ හැකියාව තහවුරු කර ගැනීමට හා ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමෙන් පසුද, එම අරමුණ සඳහාම ණය ලබා දීම අඛණ්ඩව කරගෙන යාම සඳහා චක්‍රීය අරමුදලක් ස්ථාපිත කර නොතිබුණි. අදාළ ප්‍රදේශවල වාණිජ බැංකු ශාඛා මඟින් උපණය වාරික අයකර ගන්නා බවත් දැනට ප්‍රජා සම්පත් දායකයන් විසින් එම කාර්යයන් සම්බන්ධීකරණය කරන බවත් නිරීක්ෂණය විය.

(ii) ලැබුණු තොරතුරු අනුව, 2015 අප්‍රේල් 30 දිනට එකතුව රු.මිලියන 1,071 ක් වූ ණය ශේෂ හිඟ හිට පැවති අතර ඉන් එකතුව රු.මිලියන 188.65 ක් අක්‍රීය ණය ශේෂ ලෙස හා රු.මිලියන 22.23 ක් ණය පාඩු ලෙස එදිනට පැවතුණි. පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධන සමිති 09 ක් විසින් රු.මිලියන 11.70 ක් වටිනා උපණය ලබා දී තිබූ බවත් ඉන් රු.මිලියන 1.72 ක් වටිනා උපණය ශේෂ බොල්ණය ලෙස හඳුනා ගෙන ඇති බවත් නියැදි පරීක්ෂණවලදී අනාවරණය විය. තවද මූතූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධන සමිති 04 ක් විසින් 2011 සිට 2014 දක්වා කාලපරිච්ඡේදය තුළ රු.මිලියන 5.83 ක් වටිනා උපණය ලබා දී තිබුණු අතර එම සම්පූර්ණ මුදලම 2015 අප්‍රේල් 30 දිනට අයකර ගැනීමෙන් තොරව පැවතුණු බව නිරීක්ෂණය විය.

(ඇ) 2004 මැයි 25 දින කරන ලද මුල් සැලසුම් අනුව, ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන් සඳහා පොලිනෙට් නිවාස 3,026 ක් බෙදාහැරීම සඳහා ව්‍යාපෘතිය අපේක්ෂා කර තිබුණු අතර 2014 දෙසැම්බර් 31 දිනට තථ්‍ය පොලිනෙට් නිවාස 1,229 ක් බෙදාහැරීමේ තථ්‍ය සපුරා ගැනීම සඳහා ළඟාවීමට හැකිවන පරිදි පොලිනෙට් නිවාස 1,230 ක් දක්වා 2014 ජුනි 05 දිනට ඉලක්කයන් සංශෝධනය කර තිබුණි. පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බල ප්‍රදේශයේ ප්‍රතිලාභීන් සඳහා බෙදා හරින ලද පොලිනෙට් නිවාස 20 කින් පොලිනෙට් නිවාස 04 ක් භාවිතය පිළිබඳ කරන ලද නියැදි පරීක්ෂණවලට අනුව, එම පොලිනෙට් නිවාස අරමුණු කළ කාර්යයන් සඳහා භාවිතා කර නොතිබූ බව අනාවරණය විය. එබැවින් පොලිනෙට් නිවාස බෙදාහැරීම පිළිබඳ ප්‍රයෝජනය විගණනයේදී නිශ්චය කළ නොහැකි විය.

3.3 ව්‍යාපෘති කාර්යයන් වසා දැමීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති කාර්යයන් 2015 අප්‍රේල් 30 දිනට වසා දමා තිබුණද, ස්ථාවර වත්කම් හා ලියකියවිලි භාර දීම විධිමත්ව සිදුකර නොතිබුණි. ත්‍රිකුණාමලය, මඩකලපුව හා මන්නාරම දිස්ත්‍රික්කවල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකවල පැවති මෝටර් වාහන හා යතුරු පැදි ඇතුළත් වත්කම් සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු සහිත නියමිත පරිදි අනුමත කරන ලද භාරදීමේ ලැයිස්තු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වසාදැමීම් කටයුතු පිළිබඳ 2015 අප්‍රේල් 30 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.